


# ඇස් පේන් නැති කූඹි රාළ



ඔවිදි උන්හාසි ඉමොධි ද සිල්වා

# ඇස් පේන් නැති කූඹි රාළ

ඔවිදි උන්හාසි ඉමෝධි ද සිල්වා

ඇස් පේන් නැති කුඹි රාළ
© ඔවිදි උන්හසි ඉමොධි ද සිල්වා

ISBN : 978-624-206-736-0

කතෘගේ වෙනත් කෘති
මලී

ප්‍රකාශක : මහමායා බාලිකා විද්‍යාලය
මහනුවර

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

# පිදුම

මගේ ආදරණීය

දෙමව්පියන්ටත්

ගුරුහරුකම් ලබාදුන්

ගුරු මාපියන්ටත්

ආදරණීය විදුහල් මාතාවටත්


මේ පොත

ආදරයෙන්

පුදකර සිටිමි.

එකමත් එක කාලෙක කූඹි පවුලක් හිටියා. ඒ පවුලේ හිටිය ඇස් පේන්නේ නැති කූඹියෙක්. එයාට කැමති නැහැ කූඹි අම්මායි, තාත්තයි, කූඹි නංගීයි, කූඹි මල්ලියි.

එක දවසක් මල්ලියි, නංගියි සෙල්ලම් කරන්න කැලේට ගියා. නංගී මල්ලී අතරමං වුණා.



අම්මායි තාත්තායි නංගිවයි මල්ලිවයි හෙව්වා. ඒත් නංගියි, මල්ලියි ගෙදර හිටියේ නෑ.
අම්මයි තාත්තයි බය වුණා. දැන් අපි මොනවද කරන්නේ? තාත්තා ඇහුවා.
ඔව් මාත් ඒක තමයි කල්පනා කරන්නේ අම්මා කිව්වා.
ඇස් පේන්නේ නැති ලොකු පුතාගෙන් අහමුද?




අම්මා කිව්වා. ඔව් අපි
එහෙනම් අහමු තාත්තා
කිව්වා. ඇස් පේන් නැති
කුඹී පුතා කිව්වා,
මෙහෙම. අම්මේ තාත්තේ
මම දැක්කේ නැහැ
නංගිවයි, මල්ලිවයි, ඇස්
පේන්නේ නැති ලොකු පුතා
කිව්වා.
දැන් මොනවද කරන්නේ
අම්මයි තාත්තයි ආයෙත්
බය වුණා.


ඔහොම ඔහොම ටික
වෙලාවකින් එක පාරටම
නින්ද ගිහින් හිටපු ඇස්
පේන්නේ නැති වූ ළමයාට
සුරංගනාවියක් ඇවිත්
මොනවද කරලා ගියා.

ඇස් පේන්නේ නැති පුතාට
ඇස් පේන්න පටන් ගත්තා.

එයා අම්මටයි තාත්තටයි
හොරෙන් පැනලා ගියා.









නංගිවයි, මල්ලිවයි, හොයාගෙන එන්න ඔහොම යද්දි නංගියි, මල්ලියි ඉන්නවා දැක්කා. නංගිටයි මල්ලිටයි අඬ ගැහුවා.

ඒ ගොල්ලන් අයියාගේ ළඟට ගිහින් මෙහෙම කිව්වා. ඔයාට ඇස් පේන්නේ නැතුව කොහොමද? ආවේ අයියේ?





මට දැන් ඇස් පේනවා.
මොකක්? ඔයාට ඇස්
පේනවා.


එහෙනම් අපි ගෙදර
යමුකෝ. අපි ඉක්මනටම
යමු. ගෙදර නැත්නම්
අම්මායි තාත්තායි
හොඳටම බය වෙයි අයියා
කිව්වා.
තාත්තේ, අම්මේ අපි
ගෙදර ආවා.

ඔය ගොල්ලන් කොහොමද ආවේ? අම්මා ඇහුවා. අපිව අයියා තමයි ගෙනාවේ. මොකක් එයාට ඇස් පේන්නේ නැහැනේ.

දැන් එයාට ඇස් පේනවා. කොයි දැන් එයා? අම්මේ අර ඉන්නෙ අයියා.

පුතේ එන්න ඔයා අපිට
සමාව දෙනවා නේද?

ඔව්, මම සමාව දෙනවා.
අපි ආයෙත් සතුටින්
ලස්සනට ජීවත් වෙමු.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20

ISBN :978-624-206-736-0